# මාධ්‍ය නිවේදනය

**ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2021 වර්ෂයේ පළමුවන කාර්තුව**

**2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 4.3 කින් වර්ධනය වී ඇත.**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය**

දු.ක: 94-11-2147053 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk

……………………………………………………………………………………………………………

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ පළමුවන කාර්තුව (ජනවාරි 1 සිට මාර්තු 31 දින දක්වා) සඳහා නිෂ්පාදන ප්‍රවේශය යටතේ පවත්නා මිල සහ ස්ථාවර මිල (2010) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර නිකුත් කර ඇත.

2020 වර්ෂයේ ඔක්තොබර් මාසයේ දී ආරම්භ වූ කොවිඩ් 19 වසංගතයේ දෙවන රැල්ල 2021 වර්ෂයේ පළමුවන කාර්තුවෙහි ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ද යම් බලපෑමක් ඇති කළේය. සංචාරක ව්‍යාපාරය, විනෝදාස්වාද කටයුතු වැනි ක්‍රියාකාරකම් කිහිපයක් හැරුණ විට, බොහොමයක් ව්‍යාපාර සහ ආර්ථික කටයුතු කොවිඩ් දෙවන රැල්ලෙහි බලපෑම මධ්‍යයේ පැන වූ සීමාකිරීම් යටතේ වුව ද, නොකඩවා ක්‍රියාත්මක වීම සිදු විය. මෙම වසංගත තත්ත්වය මධ්‍යයේ වුව ද රටෙහි ජන ජීවිතය නව සාමාන්‍යකරණය යටතේ ක්‍රියාත්මක වීම තුළින් බොහෝ ආර්ථික කටයුතුවල හැසිරීම සතුටුදායක මට්ටමක පැවතීම 2021 වර්ෂයේ පළමුවන කාර්තුව මුළුල්ලේ නිරීක්ෂණය කළ හැකි විය.

2020 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට සෘණ 1.8ක් ලෙස වාර්තා විය. කොවිඩ් 19 වසංගතය 2020 වර්ෂයේ මාර්තු මස මුලදී පළමුවරට ශ්‍රී ලංකාව තුළ පැතිරයාමේ අවධානම මතුවූ අතර එහිදී වසංගතය රටතුල පැතිරීම වැලැක්වීම සඳහා මුළු රටම අගුළු දැමීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට සිදුවීමත් සමග ආර්ථික කටයුතු කිහිපයක් හැරුණුවිට අනෙකුත් සියළුම ආර්ථික කටයුතු කඩාවැටීමට ලක් විය.

2021 පළමුවන කාර්තුවේ ආර්ථික වර්ධනය ගණනය කරනු ලබන්නේ, එසේ පහළ ගිය 2020 පළමුවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂවය. ඒ අනුව 2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2020 වර්ෂයේ පළමුවන කාර්තුවේ පසුබෑමට ලක් වූ ආර්ථිකය නැවත යථා තත්වයට පත්වීමක් පෙන්නුම් කරයි.

2021 වර්ෂයේ පළමුවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම පිළිබඳ ප්‍රකාශයක් නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2020 වර්ෂයේ පළමුවන කාර්තුව තුළ වාර්තා වූ සියයට 1.8ක ඍණ වර්ධන වේගය හා සසඳන විට 2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 4.3ක ධන වර්ධන වේගයක් ලෙස වාර්තා වී ඇති බව යි.

එහිදී 2020 වර්ෂයේ පළමුවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,295,432 ක් ලෙස වාර්තා වූ අතර එය 2021 වර්ෂයේ පළමු කාර්තුවේ දී රුපියල් මිලියන 2,393,922ක් ලෙස වාර්තා වී ඇත. තව ද පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය 2020 වර්ෂයේ පළමුවන කාර්තුවේ රුපියල් මිලියන 3,844,079 ක් ලෙස වාර්තා වූ අතර එය 2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී රුපියල් මිලියන 4,173,783ක් ලෙස වාර්තා විය. ඒ අනුව පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සියයට 8.6ක ඉහළ යෑමක් වාර්තා කර ඇත.

ආර්ථිකයේ ප්‍රධාන සංරචක හතර වන "කෘෂිකර්මාන්ත", "කර්මාන්ත", "සේවා" සහ "භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩු කළ බදු" 2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 7.8ක්, සියයට 29.2 ක්, සියයට 57.4ක් සහ සියයට 5.7ක් ලෙස වාර්තා වේ. තව ද 2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී පෙර වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව කෘෂිකාර්මික ආර්ථික කටයුතු සහ කර්මාන්ත ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 6.1ක් සහ සියයට 5.5ක් වශයෙන් සැලකිය යුතු වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහිදි කෝවිඩ් -19 ව්‍යාප්තිය පාලනය සඳහා පැනවූ සීමාකිරීම් මධ්‍යයේ වුව ද කෘෂිකර්මාන්ත හා කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට අවකාශ ලබා දී තිබීම මෙම වර්ධනයන් සඳහා හේතු වී ඇත. තව ද සේවා ආර්ථික කටයුතු 2020 වර්ෂයේ පළමුවන කාර්තුවට සාපේක්ෂව 2021 වර්ෂයේ පළමුවන කාර්තුව තුළ දී සියයට 3.0 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

**කෘෂිකර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන්**

2020 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී සියයට 6.5ක පසුබැසීමක් වාර්තා කර තිබූ කෘෂිකාර්මික ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් 2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී සියයට 6.1ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී බොහෝ කෘෂිකාර්මික ආර්ථික කටයුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. විශේෂයෙන්, 'තේ වගා කිරීම' (සියයට 37.9), 'ධාන්‍ය වගා කිරීම' (සියයට 34.8), 'මිරිදිය ධීවර කටයුතු' (සියයට 27.0) 'රබර් වගා කිරිම' (සියයට 16.0), 'එළවළු වගා කිරීම' (සියයට 14.5), 'පළතුරු වගා කිරිම' (සියයට 6.9), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 6.4), 'සත්ව නිෂ්පාදනය'(සියයට 5.5). 'වන වගා සහ දැව' (සියයට 5.4) 'කුළු බඩු වගා කිරිම' (සියයට 4.9) ලෙස ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, මෙම කාර්තුවේ දී 'වී වගා කිරිම (සියයට -6.3) සහ 'කරදිය ධීවර කටයුතු' (සියයට -16.0) වශයෙන් පසුබෑමට ලක්වී ඇත.

**කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන්**

2021 වර්ෂයේ පළමුවන කාර්තුව තුළදී සමස්ත කාර්මාන්ත ආර්ථික කටයුතු සියයට 5.5ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ධනාත්මක වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ නිමැවුම් කර්මාන්තය, ඉදිකිරීම් කර්මාන්තය, පතල් හා කැණීම් කටයුතු යන ආර්ථික කටයුතු වල මෙම කාර්තුව තුළ සිදු වූ ප්‍රසාරණයයි.

2020 වර්ෂයේ පළමුවන කාර්තුවට සාපේක්ෂව 2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී නිමැවුම් කර්මාන්තය සමස්තයක් වශයෙන් සියයට 6.8 ක වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී 'රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය' (සියයට 20.0), අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 15.3), 'රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදනය' (සියයට 12.9), 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන' (සියයට 8.4), 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය' (සියයට 6.0), සහ 'යන්ත්‍ර සහ උපකරණ නිෂ්පාදනය' (සියයට 8.1) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 6.3ක දායකත්වයක් සපයන 'ඉදිකිරීම් කර්මාන්තය' සියයට 3.4ක වර්ධනයක් වාර්තා කර ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ සිදු වූ මෙම වර්ධනය අනුව යමින් 'පතල් හා කැනීම්' කර්මාන්තය ද මෙම කාර්තුව තුළ සියයට 3.7ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. මේ අතර, 'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම' සියයට 2.7ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. එමෙන්ම 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම' සියයට 3.5ක ධන වර්ධන වේගයක් මෙම කාර්තුව තුළ දී වාර්තා කර ඇත

**සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන්**

සේවා ආර්ථික කටයුතු 2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී සියයට 3.0ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. සේවා අංශයෙහි මෙම ප්‍රසාරණය සඳහා 'විදුලි සංදේශ සේවා' (සියයට 19.1), 'තොරතුරු තාක්ෂණ සේවා' (සියයට 14.9), 'මූල්‍ය සේවා' (සියයට 13.1) සහ 'රක්ෂණ සේවා' (සියයට 11.4) යන උප ආර්ථික කටයුතු වල සිදු වූ වර්ධනය විශේෂයෙන් ඉවහල්වී ඇත. තව ද 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 3.7), 'ප්‍රවාහනය' (සියයට 1.0), 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 2.0) සහ 'වෘත්තීය සේවා' (සියයට 3.0) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහිදී 'නවාතැන් හා ආහාර පාන සැපයීම' උප ආර්ථික කටයුත්ත තවදුරටත් වාර්තා කර ඇත්තේ සියයට 31.9ක පසුබෑසීමකි.

2021 වර්ෂයේ පළමුවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබඳ විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP

පී.එම්.පී. අනුර කුමාර

අධ්‍යක්ෂ ජනරාල්